# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2008 අංක 28 දරන සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2008 ජූලි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2008 ජූලි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා ජනරජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි

**2008 අංක 28 දරන සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2008 ජූලි මස 25 දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 26/2005.

**සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එහි සාමාජිකයන් විසින් එකඟත්වය පළ කරන ලද රීති ප්‍රකාර එම සමාගමට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාර්යයන් කාර්යක්ෂමව ක්‍රියාත්මක කර ගෙන යාමේ කාරණය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා ගෙන තිබූ හෙයින් ද : පූර්විකාව.

එසේම, එකී පදනම එය පිහිටුවා ගත් පරමාර්ථය වන එහි නොයෙකුත් අරමුණු සහ ඊට පෙර සාර්ථකව කාරණා ඉටු කරගෙන යන ලද අතර, එය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම්කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මෙම පනත 2008 අංක 28 දරන සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සහ ඊට පසු සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනමේ (මෙහි මින් මතු "පදනම" යනුවෙන් හඳුන්වනු ලබන), දැනට සාමාජිකයන් වූ බොහෝ පුද්ගලයින් හෝ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවේ සාමාජිකයන් ලෙස මින්මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මෙයින් සංස්ථාගත කරනු ලබන සංස්ථාවේ (මින් මතු "සංස්ථාව" නමින් හඳුන්වනු ලබන) "සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද නඩු පැවරීමට හැකිය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද සහ සිය අභිමතය පරිදි වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනම සංස්ථාගත කිරීම.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් අතර, ඉස්ලාම් සංස්කෘතිය සහ සදාචාරය ප්‍රවර්ධනය කිරීම සහ ඉස්ලාම් ධර්මය අධ්‍යයනය කිරීම සඳහා උනන්දු කිරීම ;

2—PL 002864 2,750 (2008/03)

(ආ) මත්පැන්, මත්ද්‍රව්‍ය සහ දුම්බීමේ හානිකර ප්‍රතිඵල පිළිබඳව මුස්ලිම් තරුණයින් සහ මහජනයා, දැනුවත් කිරීම සහ එම පුරුදුවලට ඇබ්බැහි වූ මුස්ලිම් තරුණයින් ඉන් මුදා ගැනීම ;

(ඇ) ශ්‍රී ලාංකික පෙළගැස්ම අනුව ජාතික ඒකාබද්ධතාවය සහ සාමදානය, වාර්ගික සමගිය සහ සමාජ සාධාරණත්වය සහ සමතාවය වැඩි දියුණු කිරීම, සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) අනිකුත් ආගම්වලට ගරු කිරීමට මුස්ලිම්වරුන්ට ඉගැන්වීම සහ ආගමිකව ඉවසනසුලු භාවය යන සංකල්ප ප්‍රවර්ධනය කිරීම සහ මුස්ලිම්වරුන් සහ ශ්‍රී ලංකාවේ අනිකුත් ආගමික ප්‍රජාව අතර ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) ඉස්ලාම් ධර්මය සහ අරාබි භාෂාව උනන්දු කිරීම ඉගෙන ගැනීමට සහ මානව අයිතිවාසිකම්, ළමා අයිතිවාසිකම් සහ ස්ත්‍රී අයිතිවාසිකම් පිළිබඳව අධ්‍යයනය කිරීමට පහසුකම් සැළසීම ;

(ඊ) ඉස්ලාම් ධර්මය සහ ඉස්ලාම් ධර්මයට අදාළ වෙනත් පොදු අධ්‍යාපනික සහ ගුණාංග පිළිබඳව ඇති පොත්, වාර සඟරා, සඟරා සහ පත්‍රිකා මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම ;

(උ) ශ්‍රී ලංකාව තුළ දී සහ ඉන් පිටත සමාන පරමාර්ථ සහිත ක්‍රියාවන්හි යෙදී සිටින වෙනත් ආගමික, සහ සාමාජීය සංවිධාන සමග හිතවත් සම්බන්ධකම් ඇති කර ගෙන පවත්වා ගෙන යාම.

(ඌ) ශ්‍රී ලංකාවේ සාමාජයීය, ආර්ථික කටයුතු, සංස්කෘතික සහ අධ්‍යාපනික ප්‍රභපාධක කටයුතු ප්‍රවර්ධනය කිරීම.

සංස්ථාවේ කටයුතු පිළිබඳ කළමනාකාරීත්වය.

4. (1) සංස්ථාවේ කටයුතු එහි 6 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව, කළමනාකාරිත්ව මණ්ඩලයක් මගින් පාලනය කරණු ලැබිය යුතු ය.

(2) මෙම පනත ආරම්භවන්නා වූ දිනයට පූර්වයෙන් වූ දිනයේ දී “සංස්කෘතිය සහ සංවර්ධනය සඳහා වූ මුස්ලිම් පදනමේ” හිළ දරන මණ්ඩලය, සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

(3) මණ්ඩලය විසින්, මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ මරණය ඉල්ලා අස්වීම, හෝ ඉවත් කිරීම මගින් ඇති විය හැකි යම් පුරප්පාඩුවක්, සංස්ථාවේ රීතිවලට යටත්ව පිරවීම ද, තුනෙන් දෙකකට නොඅඩු බහුතරයක් පැමිණ ඡන්දය දෙන කළමනාකරණ මණ්ඩලයේ රැස්වීමක දී සංස්ථාවේ යම් ප්‍රයෝජනවත් සාමාජිකයකු මණ්ඩලයට අනුයුක්ත කර ගැනීම ද නීත්‍යානුකූල විය යුතු ය.

5. බැංකු ගිණුම් ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට සහ වසා දැමීමට ද, ඇපයක් සහිතව හෝ එසේ නොමැතිව මුදල් ණයට ලබා ගැනීමට, හෝ මුදල් සොයාගැනීමට ද, පරිත්‍යාග භාර ගැනීමට සහ ලබාගැනීමට ද, අරමුදල් එකතු කිරීමට සහ ඇති කිරීමට ද, සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයින් සේවයට බඳවා ගැනීම, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහකිරීම සඳහා ද, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ අරමුණු සියල්ලම හෝ ඉන් කිසිවක් ප්‍රවර්ධනය කිරීමට හෝ වැඩි දියුණුකර ගැනීමට අවශ්‍ය වන හෝ අභිලාපිත වූ සියලුම ක්‍රියා, දේවල් සහ කාරණා සිදුකිරීමට සහ ඉටුකිරීමට ද බලතල සංස්ථාවට ඇත්තේ ය. සංස්ථාවේ සාමාන්‍ය බලතල.

6. (1) මෙහි පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ රීති සංස්ථාවේ සභා රැස්වීමක දී, ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයකින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම හෝ සාමාජිකත්වයෙන් පහ කිරීම ;

(ආ) කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කරගැනීම, ඔවුන්ගේ බලතල, විනය කටයුතු, කාර්ය සහ ධුරකාලය ;

(ඇ) ධුර දරන්නන් තෝරාපත්කර ගැනීම, ඔවුන්ගේ ධුරකාලය, ඉල්ලා අස්වීම, ධුරය අත්හැර යෑම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, විනය කටයුතු සහ කාර්ය;

(ඈ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය, ගණපූර්ණය, සහ එහි වැඩකටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ අරමුදල් සහ දේපළ කළමනාකරණය.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක්, සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා පරිච්ඡින්න කිරීම (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද පරිද්දෙන්, එවැනිම රැස්වීමක දී, එවැනිම ආකාරයෙන් සිදුකළ හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් එකී රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අයවිය යුතු ණය.

7. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතුව තිබුණු සියලු ණය, ග්‍රාහක මුදල් සහ දායක මුදල් සහ මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

9. සංස්ථාව විසුරුවා හැරීමේදී සංස්ථාව විසින් සියලු ණය හා බැරකම් නිදහස් කිරීමෙන් පසුව කිසියම් දේපළක් ඉතිරිව ඇත්නම්, එම දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ අරමුණු හා සමාන අරමුණු ඇත්තා වූ ද කිසිම තහනම්ව ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට දීම හෝ ප්‍රේෂණය කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

ගිණුම් විගණනය.

10. (1) සංස්ථාවේ සියලු ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට සංස්ථාව විසින් සලස්වනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු ලවා විගණනය කරනු ලැබිය යුතු ය.

11. සංස්ථාවේ සභාපති සහ ගරු ලේකම් හෝ ගරු භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සළකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම අත්සන තැබිය යුතු ය. එසේ කරනු ලබන අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තෙකු කරන ලද අත්සනකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව

12. ජනරජයේ හෝ යම් රාජ්‍ය හෝ සංස්ථාගත මණ්ඩලයක අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් අගතියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අනෙකුත් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

13. මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.